// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/65 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

### ජනාධිපති විධානය

1. එච්. ටී. කමල් පද්මසිරි මහතා, ලේකම්, පළාත් සභා හා පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය
2. බන්දුල වික්‍රමාරච්චි මහතා, ලේකම්, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
3. සුනිල් හෙට්ටිආරච්චි මහතා, ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
4. ඒ. පී. ජී. කිත්සිරි මහතා, ලේකම්, තිරසර සංවර්ධන, වනජීවි සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
5. ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මහතා, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
6. ජනාධිපති නීතිඥ කපිල එම්. වෛද්‍යරත්න මහතා, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
7. ඩබ්ලිව්. ජේ. පී. එස්. වීරකෝන් මහත්මිය, ලේකම්, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
8. එස්. ටී. කොඩිකාර මහතා, ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
9. කේ. ජී. අශෝකා අලවත්ත මහත්මිය, ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2018 ජුනි මස 05 වැනි දින දරන ජනාධිපති විධානය මගින් උතුරු නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස කාර්යසාධන බලකායක් පිහිටුවනු ලැබූ හෙයින්ද,

තවද, යථෝක්ත කාර්යසාධන බලකායෙන් අපේක්ෂිත ප්‍රතිඵල වල ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි මානව සම්පත් නියෝජනයන් ඉතා වැදගත් සාධකයක් බැව් හඳුනාගෙන ඇති බැවින් ද,

තවද, මෙම කාර්යසාධන බලකායෙන් සාමාජික සංයුතියෙහි විවිධත්වය තවදුරටත් පුළුල් විය යුතු යැයි පෙනී යන හෙයින් ද,

තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම ඔබතුමන්ගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පෙරකී,

1. එච්. ටී. කමල් පද්මසිරි මහතා, ලේකම්, පළාත් සභා හා පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය
2. බන්දුල වික්‍රමආරච්චි මහතා, ලේකම්, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය
3. සුනිල් හෙට්ටිආරච්චි මහතා, ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
4. ඒ. පී. ජී. කිත්සිරි මහතා, ලේකම්, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
5. ඩී. එම්. ඒ. ආර්. බී. දිසානායක මහතා, ලේකම්, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
6. ජනාධිපති නීතිඥ කපිල එම්. වෛද්‍යරත්න මහතා, ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
7. ඩබ්ලිව්. ජේ. පී. එස්. වීරකෝන් මහත්මිය, ලේකම්, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
8. එස්. ටී. කොඩිකාර මහතා, ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
9. කේ. ජී. අශෝකා අලවත්ත මහත්මිය, ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

වන ඔබ පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ උතුරු නැගෙනහිර පළාත්හි සංවර්ධන කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසුවිපරම පිණිස වූ කාර්යසාධන බලකායේ සාමාජිකයින් වශයෙන් මවිසින් මෙයින් පත් කරනු ලබන අතර, පූර්වෝක්ත මුල් විධානයේ (අ) සිට (උ) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාවට නංවාලනු පිණිස අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා ලෙස ඔබට මම මෙයින් විධාන කරමි.

වර්ෂ දෙදහස් දහඅටක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

10-1457

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.